# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022**

**2024 දෙසැම්බර්/ 2025 ජනවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ මනෝවිද්‍යාව

**(නව නිර්දේශය)**

**බෞද්ධ ව්‍යවහාරික මනෝවිද්‍යාව හැඳින්වීම හා බෞද්ධ ප්‍රජානන මනෝවිද්‍යාව**

**BUPS – 28224**

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ඇතුළත් වන සේ තෝරාගත් ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

**1 කොටස**

01. පටිච්චසමුප්පාදයේ න්‍යායාත්මක පදනම පැහැදිලි කොට මානසික ගැටලු හේතුඵල සිද්ධාන්තයට අනුව ඇතිවන ආකාරය පෙන්වා දෙන්න.

02. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීම හුදෙක් පුද්ගල චර්යාව විධිමත්ව සංවිධානය කර ගැනීම සඳහා පමණක් නොව යහපත් මානසික පැවැත්මක් ඇතිකර ගැනීම සඳහා ද ඉවහල් වේ.' විමසන්න.

03. තෘප්තිමත් ජීවිතයක් ගොඩනගා ගැනීම සඳහා අදාළ බෞද්ධ ඉගැන්වීම් සමාලෝචනය කරන්න.

04. සමාජ සම්බන්ධතාවල මනෝවිද්‍යාත්මක වැදගත්කම බෞද්ධ මූලාශ්‍රයානුසාරයෙන් ගෙනහැර දක්වන්න.

05. බෞද්ධ භාවනා ක්‍රම අනුගමනය කිරීම ඉහළ ආධ්‍යාත්මික ප්‍රතිලාභයන් විෂයෙහි පමණක් නොව ලෞකික ජීවිතයේ සාර්ථකත්වය විෂයයෙහි ද අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

**11 කොටස**

06. මිනිස් සංජානන ක්‍රියාවලිය බෞද්ධ මූලාශ්‍රයානුසාරයෙන් පැහැදිලි කරන්න.

07. ප්‍රජානන ක්‍රියාවලීන්හි දී ෂඩ් ඉන්ද්‍රියන්ගේ දායකත්වය කෙබඳුදැයි බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පරීක්ෂා කරන්න.

08. චිත්ත, මනෝ, විඤ්ඤාණ යන පදයන්ගෙන් නියෝජනය වන මනසේ විවිධ ක්‍රියාකාරීත්වයන් පෙන්වා දෙන්න.

09. ප්‍රපංචකරණය හරහා ගොඩනැගෙන මතකයන් පුද්ගලයාගේ සමස්ත ජීවිතයට බලපාන ආකාරය අදාළ මූලාශ්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

10. පහත මාතෘකාවලින් හතරකට (04) ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න.

    i. විඤ්ඤාණ
    ii. සඤ්ඤා
    iii. වේදනා
    iv. මනසිකාර
    v. පපඤ්ච

****************************